# ලක්දිව නිකාය භේදය හා ඊට බලපෑ හේතු සාධක: 18 වන සියවසින් පසු භික්ෂු සංස්ථාවේ බෙදීයාම

බඹරවානේ දමිතසිරි හිමි - බෞද්ධ අධ්‍යයනාංශය

ක්‍රි.පූ. තෙවන සියවසේ ලක්දිව ආරම්භ වූ භික්ෂු ශාසනය අනුරාධපුර මහාවිහාරය කේන්ද්‍ර කරගෙන ව්‍යාප්ත විය. උඩරට රාජධානි සමය වන විට විවිධ හේතු සාධක පදනම් කරගනිමින් මෙරට භික්ෂු සංස්ථාවේ පරිහානියක් ඇති විය. 18 වන සියවසේ භික්ෂුව විනයෙන් පිරිහී ගොස් මෙරට උපසම්පදාව පවා නොමැති තත්වයකට පත් විය. භික්ෂූන් ශ්‍රමණ ධර්මයෙන් මිදී දරුපවුල් රකිමින් දුසිල් ජීවිත ගත කළ බව මන්දාරම්පුර පුවතේ සඳහන් වේ. මෙවන් අවධියක සරණංකර සංඝරාජ හිමියන් ඇතුළු සිල්වත් සමාගම විසින් පරිහානියට පත්ව පැවැති ශාසනය නගා සිටුවීමට කටයුතු කරන ලදි. සරණංකර හිමියන් උපසම්පදාව ගෙන ඒමට ගත් මුල් උත්සාහයන් අසාර්ථක වුවද තෙවන දූත ගමන සාර්ථක කරගනිමින් සියම් උපසම්පදාව මෙරට පිහිටුවා ශ්‍යාමෝපාලිවංශික නිකාය ආරම්භ කරන ලදි. අනතුරුව රාජ ආඥා හා සමාජ ක්‍රමය පදනම් කරගෙන ගොවිගම කුලයේ අයට පමණක් උපසම්පදාව ලබාදීම, මල්වතු අස්ගිරි උභය විහාර භේදය හා සීමාසංකරවාදය ආදි කරුණු ඔස්සේ එම නිකාය වර්ධනය වූයෙන් අඹගහපිටියේ ඤාණවිමලතිස්ස හිමියන් අමරපුර දේශයට ගොස් උපසම්පදා වී පැමිණ මෙරට අමරපුර නිකාය ආරම්භ කළේය. මෙම නිකාය දෙකෙහිම පැවති කුලවාදය, සීමාසංකරවාදය ආදි ප්‍රශ්න නිසා අඹගහවත්තේ සරණංකර හිමියෝ රාමඤ්ඤ දේශයට ගොස් උපසම්පදාව ලබා පැමිණ මෙරට රාමඤ්ඤ නිකාය ආරම්භ කළහ. සියම්, අමරපුර හා රාමඤ්ඤ රටවල් ථෙරවාදී බුදු දහම පැවති රටවල් නිසා මෙරටද ථේරවාද දහමේ ස්ථාවරත්වයක් ඇති විය. 19 වන සියවස වන විට සියම් නිකාය පාර්ශ්ව අටකටද, අමරපුර නිකාය අනු නිකායන් 32කටද, රාමඤ්ඤ නිකාය කොටස් දෙකකටද බෙදී තිබුණි. පසුව රාමඤ්ඤ නිකායේ භේදය අවසන් වූ අතර අමරපුර නිකායෙහි කොටස් තිස්දෙක 1960 දශකයේ කොටස් 23කට අඩු විය. නූතනය වන විට සියම් නිකායේ පාර්ශ්ව අට එලෙසින්ම පවතී. අමරපුර නිකායේ කොටස් අඩු වී ගොස් කොටස් 21කට සීමා වූ අතර අද වන විට අමරපුර හා රාමඤ්ඤ නිකාය දෙක එකතුවී සංඝ සභාවක් පිහිටුවා ඇත. 18 වන සියවසේ අග භාගයේ මෙලෙස භික්ෂු සංස්ථාව නිකාය වශයෙන් බෙදීයාමට කුලවාදය, සීමාසංකරවාදය, උඩපාත භේදය ආදි සාධක හේතු වී ඇති බව පැහැදිලිය. මෙලෙස භික්ෂු සංස්ථාව විවිධ හේතු සාධක පදනම් කරගෙන බෙදීයාම තුළ සෑම අයෙකුටම පැවිදි උපසම්පදාවීමේ අයිතිය හිමි වූ අතර ලක්දිව බුදු සමයේ ව්‍යාප්තියත්, ථෙරවාදයේ ස්ථාවරත්වයත්, භික්ෂු සංස්ථාවේ වර්ධනයත් සිදුවූ බව හඳුනාගත හැකිය.

*මුඛ්‍ය පද: භික්ෂු සංස්ථාව, කුලවාදය, සීමාසංකරවාදය, ථෙරවාදය, උපසම්පදාව*